ක්‍රියාකාරකම 4- කොටස 1

ශ්‍රේණිය: 7

වාරය : iii

නිපුණතා මට්ටම (6.4.1): ශ්‍රී ලංකාවේ පන් හා නියද කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි.

ක්‍රියාකාරකම = පන් හා නියද කර්මාන්තය පිළිබඳ දැනගනිමු, උගනිමු.

කියවීම සඳහා පත්‍රිකාව

- ❖ පන් හා පැදුරු කර්මාන්තය ඈත අතීතයේ සිට පැවත එන කර්මාන්තයකි.
- ❖ දුම්බර ප්‍රදේශය පැදුරු කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධ වේ.
- ❖ පන් කර්මාන්තය පවතින ප්‍රදේශ

කළුතර , රත්නපුර , ගම්පහ ,ගාල්ල

- ❖ විවීම සඳහා ගන්නා කොළ වර්ග

පන්, පොතු පන්, හැවන්, ගල්ලැහැ, තල කොළ, පොල් කොළ

- ❖ විවීම සඳහා ගන්නා කෙඳි වර්ග

නියද ,හණ

- ❖ විවීමේදී ගන්නා කොළ විවිධ ලෙස වර්ණ ගන්වා ගැනීම සිදුවේ. ඒ සඳහා වර්තමානයේ කුකුල් සායම් භාවිතා කරන අතර අතීතයේ පහත සඳහන් ලෙස වර්ණ සාදාගෙන තිබේ.

රතු- පතිගි දැව හා කොරකන කොළ

කහ- වෙනිවැල් ගැට හෝ අමුකහ

කොළ - කනේරු කොළ, ලුණුමිදැල්ල, කැලෑ කොහොඹ

කළු - අරළු,බුළු කොටා තම්බා ගැනීම.



හණ පත්‍රවලින් කෙඳි ලබා ගැනීම



හණ කෙඳිවලින් කළාල විවීම

විවීමට හැකි වෙනත් නිර්මාණ : වට්ටි, පෙට්ටි, මලු, අත් බෑග , හැන් බෑග, හැඳි ආන, උඩහල්ල, බත් මල්ල හා අලංකාරය සඳහා වෙනත් නිර්මාණ ද තිබේ.

දිලානි අලුත්ගෙදර- ර/ හෝප්වෙල් විද්‍යාලය